**විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (ප්‍රංශ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2014**

---

විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (ප්‍රංශ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ප්‍රංශ රජය වෙනුවෙන් නැටික්සිස් බැන්ක් ඔෆ් ෆ්‍රාන්ස් (NATIXIS Bank of France) සහ ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අතර එළඹි 2012 නොවැම්බර් 05 දිනැති අංක බී 920 ඒ 1 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2** <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ වානේ පාලම් 46 ක් සපයා ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය යූරෝ මිලියන 45.80 කට සමාන රු.මිලියන 7,564 ක් වන අතර ඉන් රු.මිලියන 3,642 කට සමාන යූරෝ මිලියන 22.05 ක් මූල්‍යයනය කිරීම සඳහා ප්‍රංශයේ " NATIXIS" බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජූලි 17 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 17 වන විට නිම කිරීමට අපේක්ෂා කෙරුණි.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර

පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැහීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

#### 2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

2014 දෙසැම්බර් 31 දිනට අතුරු ගෙවීම් සහතික 4 යටතේ අනුමත කළ රු.මිලියන 32.89 ක කළ වැඩ වටිනාකම කෙරී ගෙන යන වැඩ ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

## 3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>

### 3.1 <u>අරමුදල් උපයෝජනය</u>

ව්‍යාපෘති මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දක්වා අදාල වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | යූරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන |
| ප්‍රංශ රජය | 22.05 | 3.642 | 2.318 | 14.68 | 2.318 | 17.93 | 2.832 |
| ශ්‍රී ලංකා රජය | 23.75 | 3.922 | 924 | 2.98 | 470 | 4.12 | 651 |
| | 45.80 | 7.564 | 3.242 | 17.66 | 2.788 | 22.05 | 3.483 |

## 3.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 12 දින යූරෝ මිලියන 22.05 ක් වටිනා පාලම් සංරචක සැපයීම සඳහා විදේශ සමාගමක් සමග කොන්ත්‍රාතු ගිවිසුමකට එළඹ තිබුණු අතර පාලම් ඉදි කිරීම් වැඩ 2013 ජූලි 19 දින ආරම්භ කර තිබුණි. කොන්ත්‍රාතු ගිවිසුම් කොන්දේසි 17 ට අනුව උපයෝගි යන්ත්‍ර සමඟ පාලම් සංරචක දින 730 ඇතුළත සැපයිම් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර දින 545 ක් ඉකුත් වූ පසු උපයෝගී යන්ත්‍ර ඇතුළත්ව පාලම් සංරචක 25 ක් පමණක් සැපයිම් කර තිබුණු අතර ඉන් පාලම් 20 ක කොන්ත්‍රාත් කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව භූවිද්‍යාත්මක, ජලවිද්‍යාත්මක හා සළුල විද්‍යාත්මක සමීක්ෂණ, විස්තරාත්මක සැලසුම් හා කිරිදිවිට - ඇස්සැන්න වත්ත මාර්ගයේ පාලම් අංක 1/1 උප ව්‍යුහගත ඉදිකිරීම් කරගෙන යා යුතුය. කෙසේ වෙතත්, පාලමේ විස්තරාත්මක සැලසුම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම් සැලසුම් අංශය විසින් කරගෙන ගොස් තිබු අතර ඒ සඳහා රු.621,281 ක් වැය කර තිබුණි. එකී පිරිවැය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) පරීක්ෂණ වාර්තා ලේඛනයක් ව්‍යාපෘතිය පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පහත සඳහන් පාලම් ඉදිකිරීම් වලට අදාල තත්ත්ව පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

I. මාතලේ - ඉලුක්කුඹුර පාර - පාලම් අංක 2/8
II. මාතලේ - ඉලුක්කුඹුර - පල්ලේගම පාර - පාලම් අංක 9/8
III. වත්තේගම - කන්දේ නුවර - වාරියපාල පාර - පාලම් අංක 28/2
IV. දඹගහපිටිය - පින්නගොල්ල - ආරාව මී ගහ කිවුල පාර - පාලම් අංක 12/3

තවද, විස්තරාත්මක කොන්ක්‍රීට් සම්පින්ඩන පාලම් ඉදිකිරීම සඳහා භාවිතා කළ බව සනාථ කිරීමට ඉංජිනේරුවරයාගේ සහතිකයට තත්ත්ව පරීක්ෂණ වාර්තා ඇමුණුම් කිරීම අවශ්‍ය වුවද එසේ අමුණා නොතිබුණි.

(ඇ) බදුල්ල කරමැටිය- ආදාඋල්පත මාර්ගයේ පාලම් අංක 17/5 කොන්ක්‍රීට් සම්පින්ඩන විස්තරාත්මක තත්ත්ව පරීක්ෂණය ස්වාධීන පාර්ශවයකින් ලබා ගැනීම වෙනුවට කොන්ත්‍රාත්කරුට අයිති රාසායනාගාරයකින් සිදු කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ ජේද 8.3.9 හා 8.6 පටහැනිව රු.978,351 ක පොදු කාර්ය වියදම් හා මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක වෛද්‍ය නිවාඩු මුදල් කිරීම් රු.191,378 ක් සමාලෝචිත වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

(ආ) රු.මිලියන 81.56 පිරිවැයකට ඉදිකිරීම් කළ මීගමුව ගිරිඋල්ල මාර්ගයේ 32/2 පාලම විවෘත කිරිමේ උත්සවයේ දැන්වීම් පළ කිරිමේ ගාස්තු ලෙස රු.මිලියන 2.31 ක් වැය කර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව ව්‍යාපෘතිය උපදේශකයින් 02 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර ඔවුන්ගේ සේවා කොන්දේසි විගණනයට ඉදිරිපත් නොවුවත් පරිශ්‍රමිකයින් වශයෙන් එකතුව රු.මිලියන 2.10 ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය අධ්‍යක්ෂට ව්‍යාපෘතියේ වැඩබලන ගණකාධිකාරී තනතුර සඳහා රු.206,547 ක් 2014 මැයි දක්වා ගෙවා තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ කාර්ය මණ්ඩලය 33ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 18 කින් සමන්විත විය. පුරප්පාඩු වූ ප්‍රධාන තනතුරු අතර ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරු 02 ක්, කාර්මික නිලධාරීන් 05 ක් හා ඉංජිනේරුවරුන් 07 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බඳවා ගැනිම් නොකර තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව උපදේශතයන් 04 දෙනෙකු තාක්ෂණික සහකාරවරයකු ඇතුළත් සේවකයින් 05 හා සැහැල්ලු යන්ත්‍ර ක්‍රියාකරුවෙකු සේවයේ යොදවා රු.මිලියන 2.26 ගෙවා තිබුණි.